**දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තමිළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්විය.**

**අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදාවන් සමත් වුවද, එම සංවිධානයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැඟෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තමිළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු.**

**තමිළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.**



# තමිළිනීගේ කතාව 2

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න

## නොනවතින රැල්ල ඇරඹේ

1995 වසරෙහි දෙසැම්බර් මාසයෙහි දී යාපනය දිස්ත්‍රික්කය මුළුමනින්ම හමුදාව අත්පත් කරගැනීමෙන් පසුව විමුක්ති කොටි සංවිධානය වන්නි භූමි ප්‍රදේශය තම ප්‍රධාන පදනම කරගෙන ක්‍රියාත්මක විය. එම කාල වකවානුවෙහි දී යාපනය අහිමිවීම යනු කොටින්ට දරාගත නොහැකි දෙයක් විය. සංවිධානයේ වර්ධනයට අවශ්‍ය වන පිරිස් බලය සහ ආර්ථික ශක්තිය ලබා දෙන සම්පත්දායක ප්‍රදේශය ලෙස යාපනය පැවතුණි. එමෙන්ම 1990 වසරෙහි සිට කොටින්ගේ පරිපාලන අග නගරය වශයෙන් පැවතුණේද යාපනයයි. දේශපාලන අංශයෙහි භාරකරු වූ තමිල් චෙල්වන්, මුල්‍ය අංශයේ භාරකරු වූ තමිලේන්දි යන අය යාපනය අහිමිවීමේ පාඩුව ගැන සටන්කාමීන් අතරෙහි කීප වතාවක්ම හැඟීම්බරව අදහස් හුවමාරු කර ගත්හ. හැකි ඉක්මනින් නැවතත් යාපනය අත්පත් කරගත යුතුය යන දැඩි අදිටනින් යුතුව කොටි ක්‍රියාත්මක වූහ.

යාපනය දිස්ත්‍රික්කයෙහි ප්‍රදේශ පිළිබඳව මනා දැනුමකින් යුතු ස්ත්‍රී සහ පුරුෂ යන දෙපාර්ශ්වයෙන්ම සමන්විත සටන්කාමීහු පිරිසක් තෝරාගෙන යාපනය කරා යන බලසේනාව සංවිධානය කෙරුණි. ලුතිතන් කර්නල් මහේන්දි සහ ලුතිතන් කර්නල් තණිකෙච්චෙල්වි වෙත එම සේනාවෙහි වගකීම පැවරී තිබුණි. පුනගරී ප්‍රදේශය පසු බලඇණිය ලෙසින් තබාගෙන විමුක්ති කොටි යාපනයෙහි ස්ථානගතව සිටින හමුදාවට හිසරදයක් වන අන්දමේ ප්‍රහාර එල්ල කිරීමට පටන් ගත්හ. මෙම ප්‍රහාරවල සේනාපති ලෙස කටයුතු කළේ දේශපාලන අංශයෙහි භාරකරු වූ තමිල් චෙල්වන්ය. ඉන්දීය හමුදාව සමඟ කොටි සංවිධානය සටන් වැදුණු අවස්ථාවේ තමිල් චෙල්වන් තෙන්මරාච්චි ප්‍රදේශයෙහිදී තමන් සමඟ සිටි කුඩා කණ්ඩායම සමඟ එක්ව විශිෂ්ට අයුරින් සටන්කර නායකතුමාගේ මහත් විශ්වාසය දිනා ගත්තේය. එයට පසුව ඔහුව 1993දී දේශපාලන අංශයෙහි භාරකරු ලෙස පත්කරන තෙක්ම දිනේෂ් යන නමින් යාපනය දිස්ත්‍රික්කයෙහි සන්නද්ධ නායක ලෙසින් කටයුතු කළේය.

සංවිධානයෙහි මුල්‍ය අංශයෙහි භාරකරු වූ තමිලේන්දි යාපනය අහිමිවීම හේතුවෙන් මහත් පීඩාවට පත්වූ හැඟීමෙන් යුතුව සිටියේය. සටන්කාමියෝ සහ සේනාධිපතිවරු මුල්‍ය අර්බුධය පිළිබඳව පැහැදිලි කළෝය. සටන්කාමීන් සඳහා වන දෛනික අවශ්‍යතා, ඇඳුම්, උපයෝග භාණ්ඩ සහ වෛද්‍ය වියදම් ආදිය සඳහා මාසයකට කෝටි ගණනක් අවශ්‍ය බව තමිලේන්දි ප්‍රකාශ කළේය. දිනපතාම අරගලයේදී ජීවිත පරිත්‍යාගයෙන් සටන් කරන සටන්කාමීන්ට ''හරිහමන් විදිහට කෑම ටිකවත් දෙන්න විදිහක් නෑ'' යැයි කියා ඔහු කඳුළු සැලුවේය. ඔහුගේ වදන් පිරිස තුළ සිත් කැළඹීමට පත්කරන්නට සමත් විය. පසු කලෙක වන්නියෙහි විශාල ගොවිපළවල් ඇති කිරීමේ පදනම දමනු ලැබුවේ ඔහු විසින්ය. එමෙන්ම කොටි සංවිධානය කෙරෙහි සාමාන්‍ය ජනතාව තුළ අකැමැත්ත ඇති කළ හේතු අතරින් එක් ප්‍රධාන හේතුවක් වූ බදු අය කිරීමේ ක්‍රමය ආරම්භ කරන ලද්දේ ද ඔහු විසින්ය.




එවිට මම දේශපාලන අංශයට අයත් අධ්‍යාපන අංශයෙහි කාන්තා අංශය භාරව කටයුතු කරමින් උන්නෙමි. පොලිකණ්ඩි ප්‍රදේශයෙහි පිහිටුවා තිබුණු කාන්තා අංශය සඳහා වූ මූලික පුහුණු කඳවුරේ තිස් තුන්වන කණ්ඩායමේ පුහුණුව ලැබූ විසි දෙනෙක් වූ සටන්කාමී සහෝදරියෝ මගේ භාරයෙහි උන්හ. තෙන්මාරච්චි ප්‍රදේශයෙහි කනකම්පුලියඩ්ඩි හන්දියෙහි පිහිටුවා තිබූ අපේ කඳවුර වට්ටක්කච්චියෙහි ගොවිපළ පිහිටි භූමි ප්‍රදේශයට මාරු කර තිබුණි. දේශපාලන අංශයෙහි පුහුණු කඳවුර ක්‍රියාත්මක වූවේද එම භූමි භාගය තුළමය. එහිදී අධ්‍යාපන අංශයට සම්බන්ධ සටන්කාමී සහෝදර සහෝදරියන්ටත්, දේශපාලන කටයුතු සඳහා තෝරාගෙන සිටි තුවාල ලබා සිටි සහෝදර සහෝදරියන්ටත් දේශපාලන පන්ති ක්‍රියාත්මක විය. දේශපාලන අංශයට අයත් සටන්කාමී සහෝදර සහෝදරියන් සඳහා වන හමුවීම්, රැස්වීම් ආදියද එහි පැවැත්විණි. දේශපාලන උපදේශක ඇන්ටන් බාලසිංහම්, සංවිධානයෙහි ප්‍රමුඛයෙකු වූ බාලකුමාරන් ඇතුළු දේශපාලන විශ්ලේෂකයෝ කීප දෙනෙක් ද එහි දී පන්ති පැවැත් වූහ. 'කාන්තාවෝ සහ සමාජය' යන මාතෘකාව යටතේ මම ද එහි පන්ති පැවැත්වූයෙමි.

අරගල බිමට, සටන් පෙරමුණට සහ මූලික පුහුණු කඳවුරු ආදියට ගොස් සටන්කාමීන් හමුවී දේශපාලනික සහ සාමාන්‍ය දැනුම ලබාදීමත්, සංවිධානයෙහි ඉතිහාසය පිළිබඳව දැනුම ලබා දීමත් අපගේ අධ්‍යාපන කණ්ඩායමේ වගකීම විය. 1995ට පෙර කාන්තා බළසේනාව එකම පරිපාලන ඒකකයක් ලෙස ක්‍රියාත්මක විය. කාන්තා බල සේනාවෙහි විශේෂ සේනාධිපතිනිය, කාන්තාවන් සියලු දෙනාගේම පූර්ණ බලැති නිලධාරිනිය වූවාය. කාන්තා බළසේනාව, දේශපාලන අංශය, මුල්‍ය අංශය, රහස් තොරතුරු අංශය සහ මුහුදු කොටි අංශය යනාදී වශයෙන් ඒකක ලෙසින් වෙන්ව ක්‍රියාත්මක වීමට පටන් ගත්තේ එයට පසුවය. සටන්කාමී සහෝදරියන් සිටින සටන් පෙරමුණුවලට නිතර නිතර යෑමේ අවස්ථා මට ලැබුණු හෙයින් සටන්කාමීන්ගේ බොහෝ ප්‍රශ්න අවබෝධ කර ගැනීමට මට හැකිවිය. මුහුදු කොටි කාන්තා පුහුණු කඳවුර පිහිටා තිබූ වඩමාරච්චියෙහි කට්කෝවලම් මුහුදු බඩ ප්‍රදේශයට පවා ගොස් මම දේශපාලන පන්ති පැවැත්වූයෙමි.

1996 වසරේ ජූලි මස 17 වන දින කොටි සංවිධානය තම මුළු වැර යොදා මුලතිව් හමුදා කඳවුරට පහරදීම ආරම්භ කළේය. මුලතිව්හි පුදුකුඩියිරුප්පු ප්‍රදේශයට ආසන්නයෙහි පිහිටා තිබූ වෛද්‍ය පසු පෙරමුණෙහි මමත් මා සමඟ සිටි අධ්‍යාපන අංශයෙහි සටන්කාමීන්ද රැඳී උන්නෙමු. තුවාල ලබා පැමිණෙන සටන්කාමීන්ගේ ලේ පිටව යාම නතර කර ඔවුන්ව පසු පෙරමුණෙහි ඇති සැත්කම් මධ්‍යස්ථාන කරා හැකි ඉක්මනින් යැවීමේ කාර්යය අපි සිදු කළෙමු. නොනවතින රැල්ල නමින් නම් කර තිබූ එකී ක්‍රියාන්විතය මඟින් මුලතිව් හමුදා කඳවුර කොටින් විසින් අත්පත් කරගන්නා ලදි. මෙම ගැටුමෙහිදී කොටින් සහ හමුදා පාර්ශ්වයෙන් මිය ගිය ගණන දහසකට වඩා අධික විය. 1996දී වන්නි සටන් බිමේ පළමුවන විශාල ජයග්‍රහණය කොටි සංවිධානය නන්දි මුහුදු බඩ ප්‍රදේශයේදී ලැබුවේය. අත්පත් කරගෙන තිබූ හමුදා කඳවුරට මමත් තවත් සටන්කාමී සහෝදර සහෝදරියන් සමඟ ගියෙමි. පුළුල්ව පැතිර තිබූ බෙංගාල මුහුදේ මහත් වූ රළ මුලතිව් වෙරළේ හැපී අපගේ සටන්කාමී සහෝදර සහෝදරියන්ගේ ධීරත්වය හඬ නඟා පළ කරමින් තිබුණි.

වඩමාරච්චි ගැඹුරු මුහුදු ප්‍රදේශය අහිමි වී සිටි කොටි සංවිධානය 'මුහුදේ බලය පැතිරවිය හැකි අයට ගොඩබිමෙහිද බලය සතුය' යන න්‍යාය පදනම් කරගෙන මුලතිව් මුහුද තම ප්‍රධාන ඉලක්කය කරගනිමින් මුහුදු කොටින්ගේ ක්‍රියාකාරකම් වර්ධනය කරන්නට විය. ලංකාවේ මුහුදින් විශාල වපසරියක පාලනය තමන් සතු විය යුතුය යන දැඩි මතයෙහි සංවිධානය උන්නේය. බෙංගාල මුහුදේ ජාත්‍යන්තර මුහුදු මාර්ගයේ පවතින වාසිදායක තත්ත්වයන් හිමිකර ගැනීම කොටි සංවිධානය ආරම්භ කර තිබීම මගින් බර ආයුධ ද, කාල තුවක්කුද, පුපුරන ද්‍රව්‍යයද තම සංවිධානයට අයත් නැව් මාර්ගයෙන් කෙළින්ම ලබාගැනීමට අවස්ථාව හිමි විය. කොටි සංවිධානයට මහත් වාසිදායක තත්ත්වයක් ඇති කිරීමට තවදුරටත් දිග් ගැසෙමින් පැවැතුණ වන්නි යුද්ධය හේතු වීය. මුහුදු කොටි බල ඇණියෙහි සටන්කාමීහු පුරුෂ පාර්ශ්වයට අයත් සටන්කාමීන් සේම සම ප්‍රමාණයෙන් කාන්තා පාර්ශ්වයද සටන් පෙරමුණෙහි ඉදිරියෙන් ක්‍රියාත්මක වූහ.

මුලතිව් කඳවුර කොටින් අත්පත් කරගෙන දින කිහිපයක් ඇතුළත කිලිනොච්චිය නගරය අත්පත් කරගැනීමේ අරමුණින් 'සත්ජය 1,2,3' වශයෙන් හමුදා ක්‍රියාන්විතයක් ලංකා හමුදාව ආරම්භ කළේය. වට්ටක්කච්චියෙහි ස්ථානගතව සිටි අපගේ අධ්‍යාපන කණ්ඩායමෙහි සටන්කාමීන්ව වෙනත් ආරක්ෂිත ස්ථානයකට වහාම රැගෙන යා යුතු විය. නව සටන්කාමීන්ගේ කඳවුර පිහිටුවා තිබුණේද එම පරිශ්‍රයෙහිමය. එම කඳවුරේ භාරකරු මගේ ස්ථානයට පැමිණියේය. නව සටන්කාමීන්ව වෙනත් ස්ථානයකට කැඳවාගෙන යාම පිළිබඳව ඒ වන තෙක් දැනුම්දීමක් කර නොතිබුණු හෙයින් කළ යුත්තේ කුමක්දැයි නොදන එම භාරකරු කැළඹුණු මනසින් යුතුව උන්නේය. භයංකාර ලෙසින් එල්ලවන



38 වන පිටට